අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/4/58/16/01/13

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.07.

සම්මුඛ පරීක්ෂණ අංකය : ....................................

සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය: ......................

........................................................................ හිමි/මයා/මිය/මෙය

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා සීමිත බඳවා ගැනීම 2020/2021(2023) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම</u>**

අංක: 1928/28 හා 2015.08.21 දිනැති ගැසට් පත්‍රයේ පළකර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව, 2023.09.23 දින පවත්වන ලද සීමිත තරඟ විභාගයට අදාළ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික සම්මුඛ පරීක්ෂණයට ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වමි.

02. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා බත්තරමුල්ල, පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ............. දින පෙ.ව/ප.ව ............. ට පෙර පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.

03. එදිනට පහත සඳහන් සියලුම ලිපි ලේඛනවල මුල් පිටපත් ඇතුළත් ගොනුවක් ද, එම ලිපි ලේඛන පිටපත් මත ඒවා සත්‍ය පිටපත් බවට ආයතන ප්‍රධානියා විසින් සහ අයදුම්කරු විසින් සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපී ගොනුවක් ද, ඉහතින් දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ අංකය සහ මණ්ඩල අංකය, විෂය, නම සහ මාධ්‍යය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. (www.moe.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇති ලිපි ගොනු කවර ආකෘතියට අනුව) ඔබ විෂයයන් එකකට වැඩි ප්‍රමාණයක් සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවකු නම් එක් එක් විෂයය සඳහා වෙන වෙනම ගොනු ඉදිරිපත් කළ යුතුය.

I. සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය

II. ජාතික හැඳුනුම්පත /විදේශ ගමන් බලපත්‍රය

III. උප්පැන්න සහතිකය

IV. දිවුරුම් ප්‍රකාශය (අවශ්‍යතාවය අනුව) - අදාළ අධ්‍යාපන සහතික සහ අනෙකුත් සහතික/ ලේඛනවල සඳහන් නම්වල වෙනස්කම් පවතී නම් ඊට අදාළ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.

V. පරිවේනාචාර්ය සේවයේ/ ගුරු සේවයේ/ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පත්වීමේ ලිපිය, පත්වීම ස්ථිර කරන ලද ලිපිය හා වැඩ භාරගත් ලිපිය

VI. අයදුම් කිරීමට සුදුසුකම් ලබන සේවාවේ පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වූ බවට ලිපි සහ කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා ඇත්නම් එයට අදාළ ලිපි

VII. අධ්‍යාපන සහතික -

- අ.පො.ස සාමාන්‍ය පෙළ
- අ.පො.ස උසස් පෙළ
- ලිඛිත විභාගයෙන් සමත් (විශේෂ සේවක සංඛ්‍යාව යටතේ අයදුම් කර ඇති) විෂයයන්ට අදාළවන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධි සහතිකය හා සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය
- බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ අංක 04.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට අදාළ අනෙකුත් සහතික

VIII. බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ අංක 04 යටතේ දක්වා ඇති “සටහන 02” හා බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ අංක 09 හි වගු අංක 03 අනුව, විශේෂ සේවක සංඛ්‍යාව යටතේ අයදුම් කර ඇති නිලධාරීන්, අදාළ විෂයය ප්‍රධාන විෂයයක් ලෙස උපාධියට හදාරා ඇති බවට සහ උපාධියේ මුළු විෂය ඒකක (සම්බාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) අයදුම් කර ඇති විෂයට අදාළ විෂයයන් බවට තහවුරු කල හැකි සහතික/ලේඛන සහ එම කරුණු තහවුරු කර ගැනීමට අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් නිකුත් කළ තහවුරු කිරීමේ සහතිකයක් (www.moe.gov.lk නිල වෙබ් අඩවියේ පළකර ඇති ඇමුණුම 01 ආකෘතියට අනුව) සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළයුතු ය. (උපාධි සහතිකය අධ්‍යාපන සුදුසුකම වෙනුවෙන් ඉදිරිපත් කරන නිලධාරීන් සඳහා පමණි)

IX. සම්පූර්ණ කරන ලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ආකෘතිපත්‍රය (ඇමුණුම 02)

X. බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ අංක 05 (අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව සහ (ආ) විශේෂ සේවක සංඛ්‍යාව යටතේ දක්වා ඇති පරිදි ඉගැන්වීමේ පළපුරුද්ද තහවුරු කිරීම සඳහා සම්පූර්ණ කරන ලද ඇමුණුම 03 ආකෘතිය සහ අදාළ පාසල්වල විදුහල්පති මඟින් සනාථ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ඉගැන්වීමේ කාලසටහන් ඉදිරිපත් කළ යුතුය.

XI. මැතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය

04. අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර (2021.07.30) සම්පූර්ණ කර තිබිය යුතුය. ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතරම, අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන්ම ලබාගෙන තිබීම අත්‍යවශ්‍ය නොවේ.

05. මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉහත ලිපි ලේඛන හා සහතික පත් පරීක්ෂා කර බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් පමණක් වාචික පරීක්ෂණයට යොමු කරනු ලැබේ. අංක 2,231 හා 2021.06.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති බඳවා ගැනීමේ නිවේදනය සහ ඔබගේ අයදුම්පත්‍රය අනුව මූලික සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සියලුම සහතිකපත්/ ලේඛන සහ සහතික කරන ලද ඡායා පිටපත් එදිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර පසුව ඉදිරිපත් කෙරෙන සහතිකපත්/ ලේඛන පිළිබඳව සලකා බලනු නොලැබේ.

06. අදාළ උපාධි සහතික වල විස්තරාත්මක ප්‍රතිපල ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් කලයුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන සහතික සලකා බලනු නොලැබේ.

07. බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ අංක 04ට අදාළ “සටහන 03” අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරාලනුයේ විදේශ විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතික මත නම්, අදාළ විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල

ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් බවට එම කොමිෂන් සභාව විසින් නිකුත් කළ ලිපියක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන එවැනි ලිපි නැවත සලකා බලනු නොලැබේ.

08. නිවේදනයේ අංක 07 හී අනු අංක i, ii ,iii, iv හා v යටතේ සඳහන් වෙනත් සුදුසුකම් අයදුම්කරුවන් විසින් නියමිත දිනට සපුරා ඇති බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා වන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සනාථ කල යුතුය. (ඇමුණුම 02 ආකෘතිය අනුව)

09. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව පවත්වන වාචික පරීක්ෂණය සඳහා මිනිත්තු 20 ක කාලයක් ලබා දෙන අතර, ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම හා එම අවස්ථාවේ ලබා දෙන සිද්ධි අධ්‍යයනයක් පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට ලකුණු ලබා දීම සිදු කෙරේ.

| | | |
|---|---|---|
| 01 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම | ලකුණු 07 |
| 02 | තර්කනය හා ගැටළු විසඳීම<br>i. අවස්ථානුගත හා තනතුරෙහි කාර්යයට අදාළව විශ්ලේෂණ කුසලතාවය (ලකුණු 04)<br>ii. ගැටළුව නිවැරදිව හඳුනා ගැනීම විසඳුම් හා විකල්ප විසඳුම් ඉදිරිපත් කිරීම (ලකුණු 03) | ලකුණු 07 |
| 03 | සන්නිවේදන කුසලතාවය<br>i. සැලැස්ම (ලකුණු 02)<br>ii. ඉදිරිපත් කිරීමේ කුසලතාවය (ලකුණු 02)<br>iii. භාෂාව හැසිරවීමේ කුසලතාවය (ලකුණු 01)<br>iv. කරුණු ඒත්තු ගැන්වීමේ හැකියාව (ලකුණු 02) | ලකුණු 07 |
| 04 | පෞරුෂත්වය | ලකුණු 04 |
| | | මුළු ලකුණු 25 |

10. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ හෝ විශේෂ සේවක සංඛ්‍යාවේ එක් එක් විෂයය යටතේ හෝ පවතින පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක්වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් කැඳවන බැවින් මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පමණක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීමට සුදුසුකමක් නොවන බව කාරුණිකව දන්වමි.

11. තවද, මෙම ලිපිය ලද වහාම සතියේ දිනයන්හි රාජකාරි වේලාවක දී 0112-787330/ 0112-786674 යන දුරකථන අංකයට ඇමතුමක් ලබා දෙමින් ලිපිය ලද බව තහවුරු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

12. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

ආර්.ඩී. ජමින්ද
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)

අත්.කළේ: ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්

**අවධානයට:** නියමිත දින මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින් එවැනි ඉල්ලීම් සලකා නොබලන අතර, අදාළ ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේ දී අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.